අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 1/2008(i)

මගේ අංකය :MOJ/E10/ අති.අධි./2022
අධිකරණ අමාත්‍යාංශය
කොළඹ 12.
2022 මැයි .06.

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්
සියලුම දිසා විනිසුරුවරුන්,
සියලුම මහේස්ත්‍රාත්වරුන්,
සියලුම කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්,

මුරකරුවන් සේවයේ යෙදවීම සහ අතිකාල අනුමැතිය ලබා දීම

මුරකරුවන්ගේ රාජකාරී වෙලාවන් සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2017.11.28 දිනැති 29/2017 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් කරුණු ද සැලකිල්ලට ගනිමින් ඉහත කරුණට අදාළව නිකුත් කර ඇති 2008.02.11 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 1/2008 අවලංගු කරන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන නව විධිවිධාන 2022.05.05 දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ.

02. මුරකරු/ අධිකරණ ආරක්ෂකගේ රාජකාරී කාලය පැය 12 ක් වන අතර, පස්වරු 6.00 සිට පසු දින පෙරවරු 6.00 දක්වා හෝ පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා වේ.

2.1 මුරකරු/අධිකරණ ආරක්ෂක සතියකට දින 06 ක් සේවය කළ යුතු අතර ඉරිදා දින හා රජයේ නිවාඩු දින සාමාන්‍ය රාජකාරී දිනයන් ලෙස සැලකිය යුතුවේ. ඔවුන්ට සතියට එක් දිනයක් විවේක දිනය ලෙස හිමිවේ.

2.2 රාත්‍රී මුර රාජකාරිය ආවරණය කරන්නේ නම් දහවල් කාලය සඳහා මුරකරුගේ/අධිකරණ ආරක්ෂකගේ සේවය ලබා නොගත යුතුය.

03. 2015.07.29 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 04/2015 අනුව සියලුම අධිකරණවලට අනුයුක්ත අධිකරණ ආරක්ෂකයින් එක් ඒකකයක්(එක් සංචිතයක්) ලෙසට සලකා ආරක්ෂාව සලසා ගැනීමට උපරිමයෙන් කටයුතු කළයුතු අතර, එම අධිකරණ සංකීර්ණවල හා ප්‍රමාණවත් අධිකරණ ආරක්ෂකයින් සේවය කරන අධිකරණ සඳහා පහත පරිදි කටයුතු කළ හැකිය.

3.1 දිනකට සමාන කාලපරිච්ඡේද ලෙස ගැනෙන සේවා මුර 03ක් ක්‍රියාත්මක වන පරිදි මුරකරුවන් රාජකාරියේ යොදවන්නේ නම් ඔවුන්ගේ එක් සේවා මුරයක් පැය 08ක් වන පරිදි සකස් කළ හැකිය.

3.2 සේවා මුර ක්‍රමය යටතේ පැය 08 ක සේවා මුරයක් නියම වන නිලධරයකුට වුවද සේවා මුරය තවදුරටත් දීර්ඝ වන අවස්ථාවලදී අතිකාල සඳහා හිමිකම් ලැබිය හැක්කේ පැය 09ක රාජකාරී වේලාවෙන් ඔබ්බට ඉටු කරන රාජකාරී සඳහා පමණි.

04. ඉහත සඳහන් කර ඇති පරිදි මුර රාජකාරී සඳහා නියමිත සේවකයින් නොමැති නම් පමණක් අතිකාල මත කාර්යාල කාර්ය සහයකවරුන් මුර රාජකාරී සඳහා යොදවා ගත යුතු අතර ඔවුන්ගේ නිත්‍ය තනතුරෙහි රාජකාරී කාලය පදනම් කරගනිමින් අතිකාල දීමනා ලබා දිය හැකිය.

05. ඒ අනුව අධිකරණවල මුර රාජකාරී සඳහා යොදවන සේවක මහතුන්හට පහත පරිදි අතිකාල දීමනා ගෙවීම අනුමත කරමි.

4.1 මුරකරු/අධිකරණ ආරක්ෂකයින් සඳහා දිනකට එක් සේවා මුරයකට උපරිම අතිකාල පැය 03 කට යටත්ව හා මසකට උපරිම පැය 144 කට යටත්ව, දිවා හා රාත්‍රී සේවා මුරයන් සඳහා පැය 9න් ඔබ්බට සිදු කරනු ලබන රාජකාරී සඳහා අතිකාල දීමනා ගෙවීම.

4.2 මුරකරු/ අධිකරණ ආරක්ෂක යන කිසිදු සේවක මහතෙක් නොමැති නම්, එම රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් සේවයේ යොදවන සියලුම සේවකයන් වෙනුවෙන් මසකට උපරිම අතිකාල පැය 360 ක් ගෙවීම.

4.3 මුරකරු/ අධිකරණ ආරක්ෂක යන එක් සේවක මහතෙක් පමණක් සිටී නම්, ඔහු සේවයේ නොමැති දිනයන්හි මුර රාජකාරී සඳහා යොදවන සේවකයින් වෙනුවෙන් මසකට උපරිම අතිකාල පැය 160 ක් ගෙවීම.

4.4 මුරකරු/ අධිකරණ ආරක්ෂක යන සේවක මහතුන් දෙදෙනෙක් සිටී නම් මුර රාජකාරී සඳහා යොදවන සේවකයින් වෙනුවෙන් මසකට උපරිම අතිකාල පැය 40 ක් ගෙවීම.

06. මේ සඳහා අමතර ප්‍රතිපාදන ලබා දීමක් සිදු නොකරන අතර පවතින ප්‍රතිපාදන සීමාව තුළ මෙම වියදම් කළමනාකරණය කරගත යුතුය.

**එම්.එම්.පී.කේ.මායාදුන්නෙ**
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය

පිටපත : 1. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව
2. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධිකරණ අමාත්‍යාංශය